# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,786 — 1961 නොවැම්බර් 29 වැනි බදාදා — 29.11.1961**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය–සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිරෝධායන හා රෝග නිවාරණ ආඥාපණත

1925 අගෝස්තු මස 28 වැනි දින හා අංක 7,481 දරණ ගැසට් පත්‍රයට අතිරේකයන් වශයෙන් පළ කරන ලද්ද වූත්, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින, අංක 9,773 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි, ලිහිල් කර පළ කරන ලද්ද වූත්, නිරෝධායන හා රෝග නිවාරන ආඥා පණතේ (173 පරිච්ඡෙදය) 2 වැනි හා 3 වැනි ඡෙදවලින් දක්වෙන රෙගුලාසි යටතේ 1 වැනි රෙගුලාසිය මගින් මා වෙත පැවරෙන බලතල අනුව, නියමිත බල අධිකාරීන් වෙනුවෙන්, මේ සමඟ ඇති උප ලේඛනයෙහි දක්වෙන පරිදි, කෑගල්ල සෞඛ්‍ය අධිකාරිවරයා විසින් ''රෝග ග්‍රස්ත ප්‍රදේශයන්'' යනුවෙන් 1961 නොවැම්බර් 27 වැනි දින කරන ලද ප්‍රකාශය, සෞඛ්‍ය ඇමති ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, මෙම නිවේදනය මගින් ස්ථිර කරමි.

ඒ. පී. ජයසූරිය,
සෞඛ්‍ය ඇමති.

1961 නොවැම්බර් මස 28 දින, කොළඹ දී ය.

### උප ලේඛනය

අංක 21 දරණ කඩිගමුව වසම—කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ සහ කිනිගොඩ කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් ගල්බොඩ කෝරලේ ගොන්දිවෙල, හලගිරිය, කඩිගමුව, මාපිටිය, මිව්ලිකෙ, කෙම්පිටිය, මෝදර තැන්න, නැටියපාන සහ උඩුගම යන ගම්වලින් සමන්විත වූ සම්පූර්ණ ප්‍රදේශය, සහ

අංක 9 දරණ කිරිවන්දෙනිය වසම—එම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයටම අයත් කිනිගොඩ කෝරලේ කපුරු ගම්පොල, කිරිවන්දෙනිය, කොරිගම්මාන කොටගම, කොට්ටන්වත්ත, මලකරිය, මුවපිටිය, ඕවත්ත සහ යෝධගම යන නම්වලින් සමන්විත වූ සම්පූර්ණ ප්‍රදේශය.

අංක 47 ඒ දරණ දෙබත්ගම වසම—කෑගල්ල දිස්ත්‍රික්කයේ පරනකුරු කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් උඩබාගේ, පල්ලෙ බාගේ සහ කළුගල යන ගම්වලින් සමන්විත වූ සම්පූර්ණ ප්‍රදේශය.

11—288


ලංකාවේ වැලව්වත්තයෙහි පිහිටි " ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.

2157—ජේ. ඇන්. ඈර් 196—4,975 (11/61)